# විල්හෙල්ම් ගයිගර්ගේ සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ අධ්‍යයන ප්‍රවේශය

එම්. පී. ඒකනායක

බැවේරියානු බුද්ධිමය ක්ෂේත්‍රය පාදක කොටගනිමින් සිය අධ්‍යාපන ජීවිතයේ 'අ' යන්න කියවන ගයිගර් එය නිමා කරලූයේ, පර්යේෂණ රැසක් මඟින් සමකාලීන බුද්ධිමය ක්ෂේත්‍රයේ දැවැන්ත හිඩැස් රාශියක් පුරවාලීමෙනි. ඓතිහාසිකව පැනනැඟෙන ගැටලු, විසඳීමෙහිලා උපස්ථම්භක, නවාංග එක් කිරීමෙන් නව පර්යේෂණ ක්‍රම හා විෂය ක්ෂේත්‍ර හඳුන්වා දුන් ඔහු, ස්වකීය මූලික අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස,

- ඉන්දු-ඉරාන අධ්‍යයන
- ප්‍රාචීන භාෂා පිළිබඳ අධ්‍යයන
- ලංකාව හා එහි ඉතිහාසය පිළිබඳ අධ්‍යයන

තෝරාගනු ලැබීය. මේ අතර අනුඅධ්‍යයන රාශියක් අන්තර්ගතව පැවතුණි. ඉරාන භාෂාව හා සංස්කෘතිය, සංස්කෘත ව්‍යාකරණය, ලංකා ඉතිහාසය, පාලි භාෂාව හා සාහිත්‍යය, ශබ්දකෝෂකරණය, භාරතීය පුරාවිද්‍යාව හා භූගෝල විද්‍යාව, බෞද්ධ කලාව හා බෞද්ධ සංස්කෘතික ඉතිහාසය, සිංහල භාෂාව හා සංස්කෘතිය, ඇෆ්ගන්, දිවෙහි, වැදි, රොඩී, මාලදිවයින් වැනි උපභාෂා, සිංහල සාහිත්‍යයෙහි විකාශය, පාලි සාහිත්‍යයෙහි විකාශය වැනි අංග එකී අනුඅධ්‍යයන ක්ෂේත්‍රයන්හි වඩා වැදගත් තේමාවන් විය. මීට අමතරව කාශ්මීර, සින්ධි, ලන්ඩා, ගුජරාටි, මරාටි, හින්දි, නේපාල්, බිහාරි, බෙංගාලි, ඇසෑම්, උරියා වැනි උපභාෂා පිළිබඳවද ගයිගර් මනා අවබෝධයකින් සිටි බව දක්නට ලැබේ.

සිංහල භාෂාව පිළිබඳ ගයිගර්ගේ යොමුව හා එම අධ්‍යයනයන්හි ආරම්භය සඳහා වන, වඩා බලපෑම් සහගත මැදිහත් වීම, ගයිගර් යටතේ සිසුවකු ලෙස ඒර්ලැංගන් සරසවියේ ඉගෙනුම ලද දොන් මාටිනෝ ද සිල්වා වික්‍රමසිංහ හා බැඳෙන බව බෙෂර්ට්ගේ අදහසයි.[1] මේ පිළිබඳව අදහස් දක්වන බෙෂර්ට් පෙන්වා දෙනු ලබන්නේ දොන් මාටිනෝ ද සිල්වා යනු, සිංහල භාෂා ශාස්ත්‍ර විෂයයෙහි මූල ප්‍රවේශ හා මූලාශ්‍ර ලෙස සැලකිය හැකි පොතපත රචිත ප්‍රාමාණිකයෙකු වූ හෙයින් ගයිගර් හා මොහුගේ හමුව ගයිගර්ගේ පළමු

ලංකා ගමන මෙන්ම සිංහල භාෂාව පිළිබඳ අධ්‍යනයන්හිදී වඩා බලපෑම් සහගත වූ බවයි.[2]

ඇල්බ්‍රෙෂ් වීබර් සමරු කලාපය උදෙසා "**සිංහල භාෂාව පිළිබඳ විවිධ කරුණු**" යන මැයෙන් ගයිගර් නිබන්ධයක් සම්පාදනය කරනු ලැබූ අතර, එය සිංහල භාෂාව පිළිබඳ ගයිගර්ගේ එළඹීමේ ක්‍රමික ආරම්භයක් වන බව පෙනේ.[3] ගයිගර් විසින් සිංහල භාෂාව පිළිබඳව ඔහුගේ අධ්‍යයන මූලිකව ආරම්භ කරන ලද්දේ, 1891 වර්ෂයේ සිට වන බව විමල් ජී. බලගල්ලේ මහතා අදහස් කරයි.[4] නමුත් ගයිගර් විසින් 1895දී යථෝක්ත ඇල්බ්‍රෙෂ් වීබර් සමරු කලාපයට ඉදිරිපත් කරනු ලැබූ නිබන්ධය, සිංහල භාෂාව සම්බන්ධයෙන් වූ ගයිගර් බලපෑමෙහි වඩා වර්ධනීය අවස්ථාව ලෙස තදීය මූලාශ්‍ර අධ්‍යයනයේදී පෙනෙන්නකි.[5] එහිදී ඔහු සිංහල භාෂාව පිළිබඳව මූලික තේමා කිහිපයක් යටතේ අදහස් දක්වා ඇති බව පෙනේ.[6] ඒ අතර, පාලි භාෂාව හා සිංහලය අතර සබඳතාව දැක්වීම,[7] සිංහලයේ ආර්ය ප්‍රභව වාදයට පක්ෂව කරුණු දැක්වීම,[8] සිංහල භාෂාව යනු, ද්‍රවිඩ භාෂාවේ තවත් දිගුවක් නොවන බවට අදාළව කරුණු දැක්වීම[9] වැනි තේමා සුවිශේෂී වේ. සිංහල භාෂාව සම්බන්ධයෙන් වන ගයිගර්ගේ වඩා විස්තාරිත අධ්‍යයනයන් ඔහු සිදුකරනුයේ ස්වකීය ලාංකේය සංචාරවලින් පසුව වුවද, යථෝක්ත තොරතුරු අනුව ඊට පෙරද ගයිගර් සිංහල භාෂාව සම්බන්ධයෙන් යම් ප්‍රවීණත්වයක් හිමිකරගෙන තිබූ බව පෙනේ.

ගයිගර්ගේ පළමු ලංකා ගමනෙහි එක් අරමුණක් වූයේ සිංහල භාෂාව මෙන්ම එහි අනෙකුත් උපභාෂා හැදෑරීම වන බව ඔහුගේ සංචාරක සටහන් විමර්ශනයේදී පැහැදිලි වන්නකි.[10] ඇතැම් තැනක ඔහු තම සිංහල භාෂා අධ්‍යයනයන් ගද්‍ය පද්‍ය සම්බන්ධයෙන් සිදු කළ බව දක්වන අතර දේශීය උගතෙකු වූ සයිමන් ද සිල්වා මුදලි, ඒ සඳහා දායක කරගත් බව සඳහන් කරයි.[11] තමා සිදුකරනු ලැබූ මිහින්තලා ගමනේදී ගයිගර් තමාට හමු වූ භික්ෂුවක් අමතනුයේ සිංහල බසිනි.[12] ගයිගර් සිදුකළ මෙවැනි ක්‍රියාදාමයන් පිළිබඳ අදහස් දක්වනු ලබන බෙෂර්ට් පෙන්වා දෙන්නේ, අනාගතයෙහි තමන් ලංකාව සම්බන්ධයෙන් සිදුකිරීමට බලාපොරොත්තු වන පර්යේෂණ රාශියක පසුබිම ගයිගර් තම පළමු ලංකා ගමනින් නිර්මාණය කොට ගත් බවයි.[13] ගයිගර්ගේ එකී ලංකා ගමන පිළිබඳව 1895-12-16 සිලෝන් ඉන්ඩිපැන්ඩන්ට් පත්‍රයේ පළ වූ වාර්තාව මඟින් මේ බව මැනවින් තහවුරු කොට ගත හැකිය.[14]



ප්‍රවෘත්ති පත්‍ර සාකච්ඡාවෙහිදී ගයිගර් විසින් සිංහලයේ ආර්ය අනාර්ය බලපෑම පිළිබඳවත්, ද්‍රාවිඩියානු සම්භව සංකල්පය පිළිබඳවත්, එහි උපභාෂාවන් පිළිබඳවත් වඩා ගැඹුරු ප්‍රවේශයකට, මෙම ගමන හරහා පිවිසීමේ බලාපොරොත්තුවක් ඇති බව සඳහන් කරනු ලබයි.[15] එසේම ලාංකේය වංසකතාවන්හි විද්‍යානුකූලත්වය පිරික්සීමට පසුකාලීනව ගයිගර් පෙළඹුණේ තම පළමු ගමනේදී සිංහල භාෂාව සම්බන්ධයෙන් ලත් පරිචය නිසා වන බව පෙනේ.[16]

ගයිගර් ස්වකීය ලංකා ගමන් හරහා සිංහල භාෂා අධ්‍යයන සම්බන්ධයෙන් සිය දායකත්වය ලබාදීම පිණිස මහත් වෙහෙසක් ගෙන ක්‍රියාකළ අතර, ලාංකේය උගතුන් සමඟ නොයෙක් සබඳතා ඇති කර ගනිමින් ඔහු එහි නියුතු වූ බව පෙනේ. ඔහුගේ පළමු ලංකා ගමනේදී හික්කඩුවේ ශ්‍රී සුමංගල, වස්කඩුවේ සුභූති, රත්මලානේ ධම්මාරාම වැනි හිමිවරුන් සමඟ සබඳතා ඇතිකරගනු ලැබීම මීට නිදසුන්ය.[17] හික්කඩුවේ සුමංගල හිමියනුත් වස්කඩුවේ සුභූති හිමියනුත් සමකාලීනව සංස්කෘත පාලි පිළිබඳව ප්‍රාමාණික උගතුන් වූ හෙයින්, උන්වහන්සේලාගේ සහය තම අධ්‍යයන කටයුතු සඳහා සහාය කොට ගැනීම, මෙම සබඳතාවයන්හි මූලික අරමුණ වූ බව පෙනේ.[18] වස්කඩුවේ සුභූති හිමියන් පසුකාලීනව ගයිගර් වෙත යවනු ලැබූ ලිපිවල සිංහල භාෂාව පිළිබඳව ඔහුට අවශ්‍යය පතපොත වෙතොත්, දන්වා එවන ලෙස දක්වා තිබීමෙන් මෙම සබඳතාව, ගයිගර්ගේ සිංහල භාෂා අධ්‍යයන විෂයයෙහි බලපෑම් සහගත වූවක් වන බව පැහැදිලිය.[19] ගයිගර්, දන්තජ මෙන්ම මූර්ධජ ශබ්ද පිළිබඳව වැඩි අවබෝධයක් ලද්දේ, තමා සමඟ වැඩ කරමින් තමාට උදව් උපකාර කළ, ඒබ්‍රහම් මැන්දිස් ගුණසේකර මුදලි මෙන්ම ඔහුගේ භාෂා පරිවර්තක ලෙස කටයුතු කළ එච්. වැලන්ස්ටයින් ද සොයිසා මාර්ගයෙනි.[20]

තම ලංකා ගමන් පිළිබඳ අදහස් දක්වන ගයිගර් පෙන්වා දෙනු ලබන්නේ, යුරෝපයට වඩා සිංහල භාෂාව හා එහි සාහිත්‍යය පිළිබඳව තත්ත්වාකාරයෙන් දැන ගැනීමේ මූලික තේමාව ඔහුගේ ලංකා ගමන් හා බැඳී පවතින බවයි.[21] සිංහලයේ ඇති ලිඛිත හා කථිත වෙනස තමා අවබෝධ කොට ගන්නා ලද්දේ සයිමන් ද සිල්වා මුදලිතුමාගේද,[22] ආධාර ඇතිව උම්මග්ග ජාතකයේ විවිධ කොටස් සිංහලයේ කථිත බසට පරිවර්තනය කිරීමෙන් බව ගයිගර් පවසයි.[23] තම උපදේශකයා වූ සයිමන් ද සිල්වා මුදලිතුමා විසින් ගුත්තිලය කියවීම ඇසූ ගයිගර් සිංහල භාෂා සාහිත්‍යය පිළිබඳව සටහන් තබනුයේ පහත පරිදිය.

**"සිංහල කවි ලිවීම සඳහා ඇත්තේ විශේෂ නිදහසකි. එය සාමාන්‍ය කතාවේදී පවා දක්නට ලැබෙන නිදහස ඉක්මවන්නකි. කවියෙහි අවසන් පදයෙහි ස්වර එළිවැට රැකීමට වෙනස් කරගත හැකිය. වෘත්ත රැකීමට ස්වර හා දීර්ඝ ගුරු කර ගත හැකිය. සමාස පද භාවිතය නිදහස්ය. සංස්කෘතයේ මෙන් උපවාක්‍යවල ව්‍යාකරණය යෙදිය යුතු ස්ථානය බැඳීම්වලට යටත් නැත.**[24]

ගයිගර්ගේ යථෝක්ත සිංහල භාෂා පිළිබඳ අධ්‍යයනයන්හි දක්නට ලැබෙන සුවිශේෂතාවක් වනුයේ, භාෂාවේ ඓතිහාසික විකාශනය ගලපාගැනීම සඳහා හැකි සෑම විටම එහි වෙනස්කම් තේරුම් ගැනීමට උත්සාහ කිරීමය. මේ පිළිබඳව අදහස් දක්වන බෙෂර්ට් මෙසේ දක්වයි. **"සිංහල පාඨ ග්‍රන්ථ අධ්‍යයනයත් සමඟ දිවයිනේ සාහිත්‍යය ඉතිහාසයක් ලිවීමට අවශ්‍ය මූලික තොරතුරු එක් රැස් කර ගැන්මට ගයිගර්ට හැකි විය."**[25] එසේම ගයිගර් ස්වකීය ලංකා සංචාර පිළිබඳ අදහස් දැක්වීමේදී, තමා පසුකාලීනව සිදු කරනු ලැබූ අධ්‍යයනයන් සඳහා අදාළ වූ පොත්පත් රාශියක් රැගෙන ආ බව සඳහන් කරනු ලබයි.[26] බ්‍යුලර් පඬිවරයා විසින් සම්පාදනය කරනු ලැබූ ඉන්දු-ආර්ය පර්යේෂණ විශ්වකෝෂයේ, සිංහල අංශය (Grundriss der indo arischen philology und altertams kunde) සම්පාදනය කිරීමේදී ඔහු ලංකාවට නොපැමිණ එම අධ්‍යනයන්වල නිරත නොවූවා නම් තමාට එය නිසිලෙස ඉටු කර ගැනීමට නොහැකි වන බව ගයිගර් පවසයි.[27]

සිංහල ශබ්දකෝෂ සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කිරීම, සිංහල භාෂාව හා සාහිත්‍යය සම්බන්ධයෙන් ගයිගර් විසින් සිදුකරනු ලැබූ සුවිශේෂිතම සේවාව වන බව පැවසුවහොත් එහි ඇති වරදක් නැත.[28] එම ක්‍රියාදාමයේ මූලික අවස්ථා කිහිපයකි.

1 සිංහල ශබ්දකෝෂ සම්පාදනයක් පිළිබඳ මුල්ම අදහස ඉදිරිපත් කරනු ලැබුවේ රයින් හොල්ට් රොස්ට්ය.[29]

2 ගයිගර් හා රොස්ට් මුණ ගැසීම සිදු වූයේ 1888 වර්ෂයේ දී ය.[30]

3 රෝස්ට් විසින් සර් ජෝන්. එෆ්. ඩික්සන් වෙත විද්‍යානුකූලව සකස් වූ සිංහල භාෂාවේ ශබ්දකෝෂයක අවශ්‍යතාවය දක්වන ලදින් 1884-10-04දින රාජකීය ආසියාතික සංගමයේ මහසභා රැස්වීමේදී වස්කඩුවේ සුභූති, බී. ගුණසේකර මුදලි, ඩබ්ලිව්. පී. රණසිංහ, කොළඹ රාජගුරු ප්‍රසාදිවරයා, ආර්. ඇස්. කොපල්ටන් යනාදීන් ඇතුළත් වන සේ කාරක සභාවක් පත් කරගති.[31]



4 එහෙත් මෙහිදී සිදුවූයේ වචන මාලාවක් සකස්වීම පමණි. ශබ්දකෝෂ කාර්යයක් සිදු නොවීය.[32]

5 නැවත 1925දී එවකට රාජකීය ආසියාතික සමිතියේ සභාපති තැන්පත් සිසිල් ක්ලෙමන්ට් විසින් නැවත සිංහල ශබ්දකෝෂ සම්පාදනයක් පිළිබඳ අවධානය යොමු කරනු ලැබීය.[33]

6 එහි අරමුණ ලෙස **"භාෂාව වඩාත් යහපත් ලෙසින් වටහා ගැනීම හා සත්‍ය ලෙසම කදිම වූ නවීන සිංහල සාහිත්‍යයක් ගොඩනැගීම"** වන බව දැක්විණ.

7 ගයිගර්ගේ දෙවන ලංකාගමනය මේ අවධියේ සිදුවූ හෙයින් සිසිල් ක්ලෙමන්ට් ගයිගර් මෙයට සහභාගී කර ගැනීම සඳහා මුල්ම උත්සාහ දැරීම සිදු කරයි.[34]

8 මේ හේතුවෙන් ගයිගර් 1926-02-03දින මේ පිළිබඳ යෝජනා මෙන්ම අදහස් මාලාවක් ඉදිරිපත් කරමින් එහි ආකෘතිය හා සංවිධානය පිළිබඳව අදහස් දක්වනු ලැබිණි.[35]

9 එහෙත් සමකාලීන ශ්‍රාස්ත්‍රීය ලෝකයේ විශිෂ්ටතම යෝජනා ලෙසින් ඒවා පිළිගැනුනද, බ්‍රිතාන්‍යය මූලික උගත් පිරිසගේ නොසැලකිල්ල හේතුවෙන් ගයිගර් එම ආරාධනාව ප්‍රතික්ෂේප කොට 1926-05-26 දින ලියුමක් එවමින් තම තීරණය පිළිබඳව ලක් රජය දැනුවත් කරනු ලැබීය.[36]

10 එහෙත්, 1926-07-08 වන දින ගයිගර් කොළඹ රජයේ මහලේකම් වෙත ලිපියක් එවමින් ඊට පසුව හෝ එම පදවිය බාර ගැන්මට තමන් කැමැත්තෙන් සිටින බව ප්‍රකාශ කරනු ලබයි.[37]

11 මේ අතර 1928දී පත් කරනු ලැබූ ඉංග්‍රීසි ජාතිකයන්ගෙන් සැදුම් ලත් උපදේශක කාරක සභාවක් විසින් ශබ්දකෝෂයේ ආදර්ශනයක් (පිටු හයක් පමණ) මුද්‍රණය කොට පළ කළද එය ප්‍රාථමික ලක්ෂණවලින් යුතු වූවක් විය.[38]

12 1931න් පසු නැවත ගුණපාල පියසේන මලලසේකර මහතා විසින් මේ සම්බන්ධයෙන් නැවත ගයිගර් සමඟ ලියුම් හුවමාරු කිරීම සිදුවිය.[39]

13 මේ අතරවාරයේ ඩී. බී. ජයතිලක ශබ්දකෝෂ කාර්යයෙහි මූලිකත්වය ගනු ලබන අතර, ඔහු ප්‍රකාශ කොට සිටියේ කෙසේ හෝ මෙම කාර්ය සඳහා ගයිගර් ගෙන්වා ගත යුතු බවයි.[40]

14 ඒ අනුව 1931-01-22 දින ඩී. බී. ජයතිලකයන් විසින් ගයිගර් වෙත විදුලි පණිවුඩයක් යවමින් මේ කාර්යය සඳහා නැවත ඔහු සම්බන්ධ කොට ගනියි.[41]

15 1931-07-12 දින තමා ශ්‍රී ලංකාවේ ශබ්දකෝෂකරණ පදවිය බාර ගන්නා බවට ගයිගර් නිල වශයෙන් බැවේරියානු රජයට දැනුම් දීමත් සමඟ සිංහල ශබ්දකෝෂකරණය ඇරඹි අතර මැන්ඩලීන් හා විල්හෙල්ම් ගයිගර් යුවළ 1931-12-18 දින ලංකාවට පැමිණීමත් සමඟ එය තහවුරු විය.

ශබ්දකෝෂකරණයේ මුල් පියවර වශයෙන් ඊට අදාළ නොයෙකුත් සටහන් කැබලි හයලක්ෂයක් පමණ ගයිගර් යුවළ පරීක්ෂා කළ බව තමාගේ මතක සටහන් වල ගයිගර් දක්වා තිබීමෙන් මෙම ක්‍රියාදාමයේ බැරෑරුම් බව වටහා ගත හැකිය.[42] පෞද්ගලික වශයෙන් මෙන්ම මූල්‍යමය වශයෙන් ගයිගර් වෙත නොයෙකුත් බාධාවන් රාශියක් වුවද, කෙසේ හෝ මෙම කාර්‍ය්‍ය සාර්ථක කරගැනීම සඳහා ගයිගර් සිය වයස් තත්ත්වයවත් නොසලකා වැඩ කළ බව ඔහුගේ ලංකා ගමන් පිළිබඳ අත්පිටපත් උපුටා දක්වමින් බෙෂර්ට් පෙන්වා දෙයි.[43] ශබ්දකෝෂකරණ කාර්‍ය්‍ය අතරතුර කෘමියෙකුගේ සපාකෑමක් නිසා ඇති වූ තුවාලය දරුණු ලෙස පැසවා තිබියදී රෝහල් ගතනොවී සිටියේ, යම්හෙයකින් රෝහල් ගත වූවානම්, ශබ්දකෝෂ කාර්‍ය්‍ය නිම කරගත නොහැකි වේයැයි, යන බියෙන් වන බව හෙතෙම පවසයි.[44] ඇතැම් දවස්හි තුවාලය ගලවා දෙතුන් වතාවක් සැරව ඉවත් කිරීමට පවා සිදු වූ බව පවසන ගයිගර්, ග්‍රීෂ්ම රටවල අඳුරු පැති මෙසේ භයංකර වුවද, එම රටවල්වල සංචාරය සඳහා වන තම ආශාව නතර වීම පිණිස එය බාධාවක් නොවන බව දක්වයි.[45] මෙම සියලු බාධක මධ්‍යයේ 1932-05-01 දින ගයිගර් ශබ්දකෝෂයේ මුල් කටයුතු හමාර කරනු ලබයි. එහෙත් ඔහු තමාගෙන් පසු ශබ්දකෝෂයේ ඉදිරි විකාශය සඳහා හෙල්මර් ස්මිත් සම්බන්ධ කරනු ලැබීය.[46] මෙම සියලු ක්‍රියාදාමයන්ගේ අවසන් ප්‍රතිඵලය ලෙසින් සිංහල ශබ්දකෝෂයේ පළමුවන වෙළුම 1935දීත් දෙවන වෙළුම 1936දීත් පළකරනු ලැබීය. ගයිගර්ගේ මෙවැනි ක්‍රියාදාමයන් හා කැපවීම් ශ්‍රී ලාංකේය ඓතිහාසික ක්ෂේත්‍රය විෂයයෙහි පසුකාලීනව මහත් බලපෑමක් ඇති කරන ලද බවට සැක නැත.



ගයිගර්ගේ සිංහල ව්‍යාකරණයද ඔහුගේ සිංහල භාෂාව සම්බන්ධයෙන් වූ වැදගත් පර්යේෂණ රැසක ප්‍රතිඵලයකි. එය 1938-05-06 වන දින මුද්‍රණද්වාරයෙන් පළකරනු ලැබීය. ශබ්දකෝෂකරණයේදී ඇතිවූ අද්දැකීම්ද මූලික කොටගනිමින් සිංහල භාෂාවේ ගැටලු තැන් නිරාකරණයට ගත් උත්සාහයක් ලෙස ගයිගර්ගේ සිංහල ව්‍යාකරණය වැදගත් වේ.[47] එය සිංහලයේ ප්‍රථම ඓතිහාසික ව්‍යාකරණයයි.[48] ගයිගර් විසින් සම්පාදනය කරනු ලැබූ යථෝක්ත ව්‍යාකරණය වූ කලී 1900 වර්ෂයේ පළ වූ ඉන්දු-ආර්ය පර්යේෂණ පිළිබඳව විශ්ව කෝෂයෙහිම තවත් දිගුවක් වන බව පෙනේ.[49] එම ව්‍යාකරණයේ එන **"මේ කෘතිය පූර්වතර සිංහල ව්‍යාකරණයට වඩා සෑහෙන ප්‍රමාණයකින් වෙනස් වේ."** වැනි සඳහන් කිරීම ඊට නිදසුන්ය.[50] ගයිගර් තම මුල් සිංහල ව්‍යාකරණය පිළිබඳ කෘතියේදී සිංහල භාෂාවේ පරිණාමය,

1 සිංහල ප්‍රාකෘත යුගය
2 ප්‍රාග් සිංහල යුගය
3 මධ්‍යම සිංහල යුගය
4 නූතන සිංහල යුගය

ලෙස වර්ග කිරීමකට ලක් කරයි.[51] එහෙත් ගයිගර් විසින් 1938 වර්ෂයේදී පළකරනු ලැබූ ව්‍යාකරණයෙහි, ඔහු තම මුල් මතය සංශෝධනය කරමින් එහි අවසාන යුගය නැවත කොටස් දෙකට බෙදා දක්වා ඇති බව පෙනේ.[52] ඓතිහාසික ව්‍යාකරණයක් වීම නිසාවෙන් සිංහල භාෂාව පිළිබඳ වූ ගයිගර්ගේ එකී ව්‍යාකරණය ලාංකේය ඉතිහාසය සම්බන්ධයෙන් වඩා බලපෑම් සහගත වූ අතර, පහත සඳහන් ගයිගර් ප්‍රකාශය ඊට කදිම නිදසුනකි.

**"මුලින් පිහිටි 'ව්' නොවෙස් වී සිටින කාශ්මීර්, සින්ධි, ලංඩා, ගුජරාටි, මරාටි, භාෂාගත වචන සමුදායත්, එය 'බී' බවට පෙරලී ඇති හින්දි, නේපාල, බිහාර්, බෙන්ගාලි, ඇසෑම් සහ උරියා යන භාෂාගත ශබ්ද සමුදායක් බැලූ කල එක් කාරණයක් මට මෙනෙහි නොකොට සිටිය නොහැක."**[53]

ගයිගර්ගේ සිංහල ව්‍යාකරණය වර්තමානය වන විටද ඓතිහාසික සිංහල ව්‍යාකරණයක් පිළිබඳ ලියවුණු එකම ග්‍රන්ථයයි. ලංකාව සම්බන්ධයෙන් වූ ඉන්දීය ආභාසයේ මුල් අවධියේ සිටම ශිලා

ලිපි හා පුරාතන සම්භාව්‍ය සාහිත්‍යාගත තොරතුරු සංසන්දනය මඟින් ගොඩනඟාගත් අවබෝධය තමන් මේ සඳහා යොදාගත් බව ගයිගර් දක්වයි.[54] එහෙයින් සිංහල ලේඛන කලාවේ ආරම්භයෙහි මුල් අවධිය ලෙස සැලකෙන ක්‍රි: පූ: 307-267 වැනි මුල්කාලීන යුගයන්හි සිටම,[55] ගයිගර් දක්වන සිංහල අක්ෂර මාලාවේ ඓතිහාසික විකාශය, සිංහලය පිළිබඳ වූ ද්‍රාවිඩ ප්‍රභවවාදය පවා බිඳ දැමීමට හේතුවක් වීමෙන් මෙමඟින් වූ ඓතිහාසික බලපෑම පැහැදිලිය.[56]

තවද ගයිගර් සිංහල භාෂාවට සැපයූ නිරුක්ති කෝෂයද [57] සුවිශේෂී වූවකි. ව්‍යාකරණ ග්‍රන්ථයක ප්‍රායෝගිකත්වය සඳහා නිරුක්ති ග්‍රන්ථයක අවශ්‍යතාව සුවිශේෂි වන හෙයින්, ගයිගර්ගේම සිංහල ව්‍යාකරණය කරණකොටගෙන ගයිගර් මෙවැන්නක් සම්පාදනය කිරීම සඳහා උත්සුක වූ බව, මීට හැඳින්වීමක් සපයන ජූලියස් ද ලැනරෝල් මහතා දක්වනු ලබයි.[58] ගයිගර් විසින් 1897 වර්ෂයේදී පළ කරනු ලැබූ **''සිංහල භාෂාවේ නිරුක්ති''** නම් නිබන්ධයේම තවත් වැඩිදුර දිගුවක් ලෙස මෙය හැඳින්විය හැකිය.[59] මේ පිළිබඳ අදහස් දක්වන බෙෂර්ට් පෙන්වා දෙනු ලබන්නේ සිංහල ව්‍යාකරණය මෙන්ම, නිරුක්ති විද්‍යාව පිලිබඳ ගයිගර්ගේ යථෝක්ත කෘති දෙක, මුල්කාලීනව ජර්මන් භාෂාවෙන් ඔහු විසින් රචිත ග්‍රන්ථ, හුදෙක් නැවත පළ කිරීමක් පමණක් නොව, ඓතිහාසිකමය වශයෙන් වැදගත් වන නව කරුණු එකතු කරමින් රචිත නව සංශෝධනයන් ලෙස ඒවා වැදගත් වන බවයි.[60] මෙවැනි කෘති හරහා ඔහු ඉන්දු ප්‍රභවවාදය වඩා ශක්තිමත් කරනු ලැබූ අතර, ඔහුගේ සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ අධ්‍යනයන්හි නිතරම පාහේ මේ අයුරින් භාෂාවේ විකාශය පිළිබඳව ඉන්දු ආර්ය ප්‍රභවය තහවුරු කිරීම සුවිශේෂී ලක්ෂණයකි.[61] ගයිගර්ගේ මෙම ලක්ෂණයද, ශ්‍රී ලාංකේය ඓතිහාසික ක්ෂේත්‍රය විෂයෙහි සෘජු බලපෑම් ඇති කරනු ලැබූවකි.

ශ්‍රී ලාංකේය භාෂාවන් හා සාහිත්‍යය විෂයෙහි ගයිගර්ගේ බලපෑම තදින් දක්නට ලැබේ. ඒ අතර සිංහල භාෂාව පිළිබඳ ඔහුගේ බලපෑම වඩාත් සුවිශේෂී වූවක් වන බව ඉහත කරුණු විස්තාරණයේදී මැනවින් පෙනෙන්නකි. එහිදී සිංහල භාෂාවෙහි යුග කරණය, අක්ෂරයන්හි ඓතිහාසික විකාශය එහි ප්‍රභවය සම්බන්ධයෙන් ගයිගර් ඉදිරිපත් කරනු ලැබූ අදහස් වඩා වැදගත් වෙයි. ගයිගර්ගේ මෙම අදහස් ශක්තිමත් කරලීමෙහිලා පාලි, සංස්කෘත, ගුජරාටි, මරාටි,



බෙංගාල, බලුචි, දිවෙහි, වැදි, රොඩී, මාලදිව් යන භාෂාවන් පිළිබඳ ඔහු කෙරෙහි වූ භාෂා ඥානය සෘජු සාධකයක් විය. ලාංකේය උප භාෂාවන් පිළිබඳවද ගයිගර්ගේ ප්‍රවේශ අතිශය වැදගත් වෙයි. එම උප භාෂාවන් ලාංකේය ඉතිහාසය ගොඩනැඟීමෙහිලා ඌනපූරණ වශයෙන් භාවිත කරමින් එමගින් සිංහල භාෂාව සම්බන්ධයෙන් වූ නව අධ්‍යයන ක්ෂේත්‍ර විවර කරන ලද්දේ ගයිගර් විසින් වන බව පෙනේ. මෙම එළඹීම් පසුකාලීනව ලාංකේය ඓතිහාසික ක්ෂේත්‍රයෙහි නවමු ගතිකතා රැසකට මඟ පාදනු ලැබීය.

**ආන්තික සටහන්**

---

Heinz Bechert, **Wilhelm Geiger,** German Cultural Institute, Colombo, 1995, P. 21.

2 Ibid, P. 20.

3 හෙල්මුත් ෆොන් ග්ලෙසෙනප්, ''ඉන්දිය භාෂා ශාස්ත්‍ර විශාරද විල්හෙල්ම් ගයිගර්'', **ගයිගර් සමරුව,** සංස්. ලබුහේන්ගොඩ චන්ද්‍රරතන හිමි, ධාරා පාළි සඟරා සම්පාදක මණ්ඩලය, 1967, 18-22 පිටු; Heinz Bechert, **Wilhelm Geiger,** 1995. P. 21; සිංහල **විශ්වකෝෂය (නවය කාණ්ඩය), සංස්.,** කේ. එන්. ඕ. ධර්මදාස, සංස්කෘතික දෙපාර්තමේන්තුව, , 1998, 266 පිට.

4 විල්හෙල්ම් ගයිගර්, **සිංහලයේ වාග්විද්‍යාත්මක ස්වරූපය**, පරි., විමල් ජී. බලගල්ලේ, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 2001, 21 පිට.

5 මෙය ඇල්බ්‍රෙෂ් වීබර්ගේ ආචාර්‍ය උපාධි ලැබීමේ ස්වර්ණ ජයන්ති උත්සවයට සිහිවටනයක් වශයෙන් ඔහුට ලබා දුන් ''ගුරු පූජා කෞමදී'' නම් නම් ග්‍රන්ථයයි.

6 Heinz Bechert, **Wilhelm Geiger**, 1995, P. 27.

7 Ibid.

8 Ibid, P. 27.

9 Ibid.

10 විල්හෙල්ම් ගයිගර්, **අසිරිමත් ලංකාව,** 2004, 122 පිට.

11 ''මාගේ සිංහල භාෂා අධ්‍යයන කටයුතු වලදී මා විසින්ම කළ පර්යේෂණයන්ට අමතරව ඇතැම්දේ පිළිබඳව දේශීය පඬිවරයෙකුගේ සහය ලබා ගතිමි. විශේෂයෙන්ම එසේ කරන ලද්දේ සම්භාව්‍ය ගද්‍ය පද්‍ය අධ්‍යයනයේදීය'', එම, 134 පිට.

12 එම, 256 පිට.

13 "In this paper there are alredy clear singns of the interest which was later to impel to delve deeply in to the history of lankan" Heinz Bechert, **Wilhelm Geiger,** 1995, P. 35.

14 Ibid, PP. 36-38.

15 Ibid,

16 "මහාවංසයේ එන තොරතුරු සිංහල ශිලා ලේඛන හා අනෙකුත් ඉන්දියානු කෘතිවල එන විස්තර හා ගලපා බලන විට විශ්වසනීය වනබව කිව යුතු ය, විල්හෙල්ම් ගයිගර්, **අසිරිමත් ලංකාව,** පරි., මහින්ද පතිරණ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2004, 123-124 පිටු.

17 Heinz Bechert, **Wilhelm Geiger,** 1995, P. 40.

18 Ibid, PP. 40-42

19 "Dear and honoured sir,…please write me for any pali, sinhales, or any other book that you may require Ceylon. And I shall be vedy ready to send them to you", Ibid, P. 44.

20 Ibid, P. 46.

21 Ibid, P. 47, 48.

22 මොහු සමකාලීනව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුවෙහි පාඨ්‍ය ග්‍රන්ථ රැසක කතුවරයා වන බව ගයිගර් දක්වයි. කැළණි ගඟේ මහ ගංවතුර (1872), වේල්ස් කුමාරයාගේ ලංකා ගමන (1875), වැනි පද්‍යයනුත්, 1893 වර්ෂයේ කොළඹදී ප්‍රකාශයට පත්කළ උම්මග්ග ජාතක සංස්කරණයත් මොහුගේ සාහිත්‍ය ඥාණයට උදාහරණයත් වනබව දක්වයි.

23 Heinz Bechert, **Wilhelm Geiger,** 1995, P. 48.

24 Ibid, P. 49.

25 Ibid, P. 50.

26 Ibid, P. 50.

27 Ibid, P. 51.

28 මේ සඳහා පසුබිම සැකසෙන ආකාරය පිළිබඳව මෙම නිබන්ධනයේ දෙවන පරිච්ඡේදයෙහිදී කරුණු දැක්වීමු.

29 මොහු තම ආචාර්ය උපාධි නිබන්ධනය සිදු කරන ලද්දේ සිංහල භාෂාව සම්බන්ධයෙනි. පාලි මෙන්ම පුස්කොළ පොත් පිළිබඳව විශේෂඥයෙකු වූ මොහු 1869 වර්ෂයේදී ලන්ඩන් නුවර ඉන්දියා කාර්යාලයීය පුස්තකාලාධිපති විය.

30 ගයිගර්ගේ එංගලන්ත සංචාරයේදී මෙය සිදු විය.

31 සමකාලීනව රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ සභාපති මොහු විය. පාලි භාෂාව පිළිබඳ ප්‍රවීණයෙකි.

32 මෙයට හේතුව ලෙස දක්වා ඇත්තේ, ශබ්දකෝෂ සම්පාදනය පිළිබඳ ප්‍රාමාණික දැනුමැත්තෙකු නොවීමෙන්, එය පසුවට කල් දමන ලද බවය.

33 මොහු තම ධූරයේ වැඩ භාරගැත්මේ මුල්ම දේශනයෙහිදීම, සිංහල ශබ්ද කෝෂයක අවශ්‍යතාව, එහි මූලික අරමුණු සමඟ ගෙනහැර දක්වන ලදී.

34 ජූලියස් ද ලැනරෝල්, රාජකීය ආසියාතික සංගමයේ ශත සංවත්සරය නිමිත්තෙන් "සිංහල ශබ්දකෝශය හා රාජකීය ආසියාතික සමිතියේ ලංකා ශාඛාව (Sinhalese Dictionary And The Ceylon Branch oF The Royal Asiatic Soiety)" යන මැයෙන් 1945 වර්ෂය තෙක් එහි කාලය අළලා රචිත ලිපියක **"ශබ්දකෝෂයක් රචනා කිරීමේදී ඊට උචිත නියම ශාස්ත්‍රීය ක්‍රමය ගයිගර්ගේගෙන් ලබාගෙන මිස ඔහුට දෙවන ලංකා ගමන නිමා කොට සිය රටට යාමට නොදෙන බවට"** සිසිල් ක්ලෙමන්ටි අධිෂ්ඨාන කොට සිටි බව ලැනරෝල් සඳහන් කරයි.

35 ගයිගර්ගේ අදහස් ක්‍රියාත්මකවීමට පෙර යුරෝපීය වියතුන් පිරිසක් විසින් එක්ව සැකසූ ශබ්දකෝෂයේ මුල් ආදර්ශ පිටු කිහිපය, ගයිගර්ගේ අදහස්, පසෙකලා ක්‍රියාත්මක වීම හේතුවෙන්, ගයිගර්ගේ අදහස් නොවැදගත් තැනකට පත් විය.

36 මෙම උගත් පිරිස "ලන්ඩන් කමිටුව" ලෙසින් හඳුන්වනු ලැබූ බව බෙෂර්ට් සඳහන් කරයි. කොළඹ ශබ්දකෝෂ කාර්යාලය හා මොවුන් අතර කිසිදු අන්‍යෝන්‍යය සබඳතාවක් නොවූයෙන් ශබ්දකෝෂකරණ ක්‍රියාදාමය අතිශය අසාර්ථක වූ බව හෙතෙම තවදුරටත් සඳහන් කරනු ලබයි.

37 "Dear professor Geiger,.. The government has Receved this intimation with much regret, though it was not unexpected, and it highly appreciates ypur offer of assistance in the future, of which it will not fail to take advantage should occation arise" මෙය ගයිගර් විසින් කොළඹ රජයේ මහලේකම් වෙත 1926-07-08 දින එවනු ලැබූ ලිපියෙන් කොටසකි. Heinz Bechert, **Wilhelm Geiger,** 1995, P. 97, 98.

38 මෙහිම 126 වන පාදක සටහන යටතේ දක්වා ඇත්තේ ද මෙම (128) පාදක සටහනට අදාළ විස්තරයේ දැක්වෙන කමිටුවමය.

39 අග්‍රගණ්‍යය පාලි වියතෙකු වන මොහු ලෝක බෞද්ධ සම්මේලනයේ ආරම්භක සභාපති මෙන්ම බෞද්ධ මහා විශ්වකෝෂයේ ප්‍රධාන කර්තෘ ලෙස කටයුතු කළ අයෙකි. විශ්වකෝෂ සම්පාදනයෙහිදී ඒ සඳහා පැවති බාධක පිළිබඳ, ගයිගර් දැනුවත් කරමින් ඊට විසඳුම් සෙවීම මත එහි ආරම්භය ඉක්මනින් සිදු වූ අතර එය මොහු නිසාවෙන් එසේ විය.

40 මොහු සිංහල බෞද්ධ ජාතික පුනරුත්ථාපන සටනේ නායකයෙකු ලෙසත් 1931 ලංකාණ්ඩුවේ අමාත්‍ය මණ්ඩලයේ සභාපතිවරයෙකු ලෙසත් කටයුතු කරනු ලැබුවෙකු හේතුවෙන් ගයිගර් ගෙන්වාගැනීමේදී මොහුගේ මැදිහත් වීම වඩාත් බලපෑම් සහගත විය.

41 "ගයිගර්ගේ යාවජීව මිත්‍රයා වූ මෙන්ඩිස් ගුණසේකර මුදලිතුමා ගයිගර් ලංකාවට ගෙන්වාගැනීමේදී මූලිකයා ලෙස කටයුතු කරනු ලැබීය. ගයිගර් හා සර් ඩී. බී. ජයතිලක අතර සබඳතාව ගොඩනැගුවේ මොහුය. "Geiger's old friend, A. Mendis Gunasekara, made the first in formal approach. Then, on 22 january 1931, sir D.B. jayatilaka sent a telegram to Geiger at neubiberg", Heinz Bechert, **Wilhelm Geiger**, 1995, P. 100.

42 Ibid.

43 Ibid.

44 Heinz Bechert, **Wilhelm Geiger**, 1995, P. 102.

45 "Thanks to his wife's constant and devoted care-she changed the dressings two or three times daily. He was able to keep working on the dictionary……so I came to know dark side of the tropical life. But even so, I am not cured of my longing for the tropics", Ibid, P. 102.

46 Ibid, P. 103.

47 "මහාචාර්ය ගයිගර් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇති (A Grammar Of The Sinhalese Language) නම් ග්‍රන්ථයේ සිංහල අනුවාදයක් වන මෙය සිංහල භාෂාවේ ඓතිහාසික සංවර්ධනය නිරවුල් කිරීමට කරන ලද මහත් ප්‍රයත්නයක ප්‍රතිඵලයකි." විල්හෙල්ම් ගයිගර්, **සිංහල භාෂාවේ ව්‍යාකරණය,** රාජ්‍යභාෂා

දෙපාර්තමේන්තුව, 1964, මේ පිළිබඳ වැඩි විස්තර සඳහා නන්දදේව විජේසේකර මහතා විසින් සපයා ඇති පෙරවදන බලන්න.

48 විල්හෙල්ම් ගයිගර්, **සිංහලයේ වාග්විද්‍යාත්මක ස්වරූපය,** පරි., විමල් ජී බලගල්ලේ, 2001, 18 පිට.

49 එම.

50 එම.

51 එම, 19,20 පිටු.

52 විල්හෙල්ම් ගයිගර්, **සිංහල භාෂාවේ ව්‍යාකරණය,** 1964, 1-8 පිටු; විල්හෙල්ම් ගයිගර්, **සිංහලයේ වාග්විද්‍යාත්මක ස්වරූපය,** පරි., විමල් ජී බලගල්ලේ, 2001, 20 පිට.

53 විල්හෙල්ම් ගයිගර්, **සිංහල භාෂාවේ ව්‍යාකරණය,** 1964, XII පිට.

54 එම, VII-XIV පිටු

55 ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි, **සිංහල අක්‍ෂර රූප විකාශය හා භාරතීය ආභාසය**, S And S මුද්‍රණාලය, කොළඹ, 2005. 1 පිට.

56 ''සිංහලයෙහි ද්‍රවිඩ භාෂාමය මූල ලක්‍ෂණ'' යන මැයෙන් ඥාණප්‍රකාශර් නම් පූජකතුමා ලියා ඇති ලිපිය ගැන විමසීමකට බැසීම මෙතැනදී කිසිසේත්ම නුවුවමනාය. මේ කතුවරයා ද්‍රවිඩ භාෂාව ඉතා හොඳින් දත්තෙක් විය හැකිය. එහෙත් ඔහු, වාග් විද්‍යානුකූල පිරික්සුම් පිළිබඳ විද්‍යානුකූල ක්‍රමයක් ගැන කිසිදු දැනුමක් නැත්තෙකු සේ පෙනේ; නැතහොත් ඒ ක්‍රමයට ආලිස්සම් කරන්නෙකු සේ පෙනේ.....භාරතය ආක්‍රමණය කළ ආර්යයන්ගේ බස එහිදී ද්‍රවිඩ භාෂාවන්ගේ බලපෑමට ලක් වූ බව නිසැකය. එසේ වුවත් ඉතා පැරණි ඉන්දු ජර්මානු කාල පරිච්ඡේදයේදී එවැනි බලපෑමක් පැවතියැයි පිළිගත නොහැක'', විල්හෙල්ම් ගයිගර්, **සිංහල භාෂාවේ ව්‍යාකරණය,** 1964, VII පිටු.

57 Wilhelm Geiger, **An Etymological Glossary Of The Sinhalese Language**, The Royal Asiatic Society, Colombo, 1941.

58 "This as well as him Sinhalese grammer (1938), he considered as a part of his work an the Sinhalese dictionary and gifted it, as he had alredy done the grammar, to the dictionary manaying committee of the royal Asiatic society, Ceylon branch", Ibid, prefatory note by Julius de lanerole, P. V.

59 Wilhelm Geiger, **An Etymological Glossary Of The Sinhalese Language,** 1941, prefatory note by Julius de lanerole, P. V.

60 Heinz Bechert, **Wilhelm Geiger,** 1995, P. 106.

61 D. B. Jayatilaka, **A Dictionary of Sinhalese language, Vol-I, part-I,** The Royal Asiatic Society, Colombo, 1935, මෙම ග්‍රන්ථයෙහි ''සිංහල භාෂාව හා සාහිත්‍යය'' යන මැයෙන් මෙහි ඉදිරිපත් කොට ඇති පිටු අංක XVII සිට XXXVIII දක්වා වූ අති දීර්ඝ ලිපිය අවසානයෙහි ලිපි රචකයින් ලෙස ඩී. බී. ජයතිලක මෙන්ම විල්හෙල්ම් ගයිගර් යන දෙදෙනාගේම නම් සඳහන් වෙතත්, එම ලිපිය සම්පූර්ණයෙන්ම ගයිගර් විසින් රචනා කරනු ලැබූවක් වන බව බෙෂර්ට් පවසයි. Heinz Bechert, **Wilhelm Geiger,** 1995, P. 102, 103.